## දෙසැම්බර් 29
## නත්තල් සතියේ පළමු සතිය

පළමුවන දේව ප්‍රකාශනය 1 ජොහාන් 2:3-11

ශුද්ධ වූ ජුවාම් තුමන් විසින් ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

සිය සහෝදරයාට ප්‍රේම කරන්නා ආලෝකයෙහි සිටියි.

අපි දෙවියන් වහන්සේගේ ආඥා පිළිපදිමු නම්, එයින් අප උන් වහන්සේ දන්නා බව සහතික වේ. "මම උන්වහන්සේ දනිමි"යි කියමින් උන් වහන්සේගේ ආඥා නොපිළිපදින තැනැත්තා බොරුකාරයෙකි. සත්‍යය ඔහු තුළ නැත. එහෙත් යමෙක් උන් වහන්සේගේ දහම පිළිපදින්නේ ද, ඒකාන්තයෙන්ම ඔහු තුළ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සම්පූර්ණ වී ඇත. අප උන් වහන්සේ තුළ සිටින බව දැනගන්නේ මෙසේය. උන් වහන්සේ තුළ ජීවත් වන්නේ යයි කියන තැනැත්තා, ක්‍රිස්තුන් වහන්සේ ජීවත් වුණාත් මෙන් ජීවත් විය යුතුය. ප්‍රේමවන්තයෙනි, මා ඔබ හට ලියා එවන්නේ අලුත් ආඥාවක් නොව, පටන් ගැන්මේ සිටම ඔබ අතර තිබුණු පැරණි ආඥාවය. ඒ පැරණි ආඥාව නම් ඔබ අසා ඇති පණිවුඩයමය. කෙසේ වෙතත් මා ඔබ වෙත ලියා එවන මෙම ආඥාව අලුත් එකකි. එහි සත්‍යය ක්‍රිස්තුස් වහන්සේ තුළ ද ඔබ තුළ ද විද්‍යාමාන වී ඇත. මන්ද, අන්ධකාරය පහව යන්නේය. සැබෑ ආලෝකය දැනටමත් බැබළෙන්නේය. ආලෝකයෙහි පවතිමි යි කියමින් සිය සහෝදරයාට වෛර කරන්නා තවමත් අන්ධකාරයෙහි සිටියි. සිය සහෝදරයාට ප්‍රේම කරන්නා ආලෝකයෙහි සිටියි. ඒ නිසා පැකිළී වැටීමට හේතුවක් ඔහුට නැත. එහෙත් සිය සහෝදරයාට වෛර කරන්නා අන්ධකාරයෙහි හැසිරෙයි. අන්ධකාරයෙන් ඔහුගේ ඇස් අන්ධ වී තිබෙන බැවින් තමා යන්නේ කොහේ දැ යි ඔහු නොදනියි.

දේව වචනය මෙසේය.

<u>පිළිතුරු ගීය</u> <u>ගීතාවලිය 96:1-3, 5-6</u>

ඔබගේ පිළිතුර: සගලොව ද නරලොව ද ප්‍රීති ප්‍රමෝද වේවා!

ගීය: සමිඳුන් හට නව ගීයක් ගයන්න.
පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න.
සමිඳුන් හට ගී ගයා, එතුමන්ගේ නාමයට ආසිරි පතන්න.

එතුමන්ගේ ගැළවීමේ ශුභාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්න.
විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න.
ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

ජනතාවගේ සියලු දෙවිවරු පිළිම පමණකි.
සමිඳාණෝ ම දෙව් ලොව මැවූ සේක.
ගෞරවය ද තේජස ද එතුමන් අබිමුව පවත්නේය.
ශක්තිය ද ශෝභාව ද එතුමන්ගේ මැඳුරෙහි ඇත්තේය.

<u>සුපුවත් ජය නද</u>

ආලේලූයා! ආලේලූයා!

ගැළවීම මාගේ දෙනෙතින් දුටිමි. එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද විජාතීන්ට එළිය දෙන ආලෝකය ද ඔබේ සෙනග වන ඉශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද වන්නේය.

ආලේලූයා!

සුවිශේෂය ලූක් 2: 22–35

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"විජාතීන්ට එළිය දෙන ආලෝකය ද ඔබේ සෙනඟ වන ඊශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද මම දුටිමි! "

මෝසෙස්ගේ ව්‍යවස්ථාව අනුව ඔවුන්ගේ පවිත්‍ර වීමේ කාලය පැමිණියෙන්, ඔව්හු උන් වහන්සේ සමිඳාණන් වහන්සේට කැප කරනු වස්, ජෙරුසලමට ගෙනාහ. එසේ කළේ, "හැම කුලුඳුල් පිරිමි දරුවෙක් ම සමිඳාණන් වහන්සේට කැප ය"යි සමිඳාණන් වහන්සේගේ ව්‍යවස්ථාවලයෙහි ලියා ඇති ලෙස, දරුවා සමිඳාණන් වහන්සේට ඔප්පු කරන පිණිසත්, එහිම කියා ඇති පරිදි කොබෙයියන් දෙදෙනෙකු හෝ පරෙවි පැටවුන් දෙදෙනෙකු හෝ පූජා කරන පිණිසයත් ය. එකල, සිමියොන් නම් මිනිසෙක් ජෙරුසලමෙහි විසීය. ඔහු ඊශ්‍රායෙල්වරුන්ගේ විමුක්තිය අපේක්ෂාවෙන් සිටි දැහැමි බැතිමතෙකි. ශුද්ධාත්මයාණෝ ඔහු කෙරෙහි වැඩහුන්හ. සමිඳාණන් වහන්සේ අභිෂේක කළ 'ක්‍රිස්තුන් වහන්සේ දක්නට පෙර ඔහු මරණය නොදක්නේ ය'යි ශුද්ධාත්මයාණන් විසින් ඔහුට අනාවරණය කරනු ලැබ තිබිණි. ඔහු ශුද්ධාත්මානුභාවයෙන් දේව මාලිගාවට පැමිණියේය. ළදරු ජේසුස් වහන්සේ පිළිබඳව ව්‍යවස්ථාවෙහි සඳහන් වත්පිළිවෙත් ඉටු කරනු වස්, දෙමවුපියන් උන් වහන්සේ ගෙනා විට, ඔහු උන් වහන්සේ දෝතින් වඩාගෙන මෙසේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කෙළේය. "සමිඳුනි ඔබ පොරොන්දු වූ ලෙස දැන් ඔබගේ දාසයා හට, ශාන්ති සිතින් යාමට ඔබ නිදහස දී ඇත. මන්ද, ගැළවීම මාගේ දෙනෙතින්ම දිටිමි. එය සකල ජාතීන් අබිමුව කළ ගැළවීම ද විජාතීන්ට එළිය දෙන ආලෝකය ද ඔබේ සෙනඟ වන ඉශ්‍රායෙල්වරුන්ගේ මහිමය ද වේ." උන්වහන්සේ පිළිබඳව කී දේ ගැන උන් වහන්සේගේ පියා ද මවු ද මවිත වූ හ. සිමියොන් ඔවුන්ට ආශිර්වාද කරමින් උන් වහන්සේගේ මව වූ මරිය තුමීට කතා කොට, "මේ දරුවා ඉශ්‍රායෙල්හි බොහෝ දෙනෙකුගේ වැටීම හා නැඟීම පිණිසත්, ප්‍රතික්ෂේපයට ලක් වන දේව සලකුණක් වන පිණිසත්, නියම ව සිටී. එසේය, ඔබේම හදවත කඩුවකින් අනිනු ලැබුවාක් මෙන් තුවාල වනු ඇත. මෙසේ වන්නේ, බොහෝ දෙනෙකුගේ සිත්හි රහස් කල්පනා එළිදරව් වන පිණිස ය"යි කීය.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.